


විදුදය

භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2023, 02 (02): 15-25

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

# ශ්‍රී ලංකාවේ කඳුකර සිංහල මානව සංස්කෘතිය: කොළොන්න කෝරළයේ කඳුකර ගම්මාන ආශ්‍රිත ප්‍රදේශීය භාෂාව මත සිදුකරන ලද සංකල්පීයකරණ අධ්‍යයනයක්

## Sinhalese Hill Culture in Sri Lanka: A Conceptual Study of the Regional Language in Hill Areas of Kolonna Korala

කුසුමලතා ලංකාමුල්ල[1], ජී. ඒ. එච්. විරංග[2]

මහාචාර්ය[1], පර්යේෂණ සහකාර[2]

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
klankamulla@sjp.ac.lk[1] hashanviranga24@gmail.com[2]

## Abstract

There is a unique cultural significance and identity in the cultural life of the Sinhalese villagers who reside in hill areas of Sabaragamuwa, Uwa and Central provinces. It was observed that this hill culture is different from the Sri Lankan established village. Hill country Sinhalese are entwined with the geographical hill area economically, socially, religiously, agriculturally and politically. Hill country and humans are interconnected with cultural values and factors. This study attempts to study the regional language of hill country culture and introduce it to Sri Lankan academic discourse. It is proposed to explore hill country community as a social structure different from traditional village community. The objective of the study was to identify the cultural identity of hill country community and propose the cultural and theoretical foundation which is necessary to understand their social, economic political and religious needs. This is a qualitative research study conducted using inductive method. Sri Lankan village is recognized with the 'lake, stupa, village, temple' concept. It is the main concept with reference to village in cultural discourse. It was conceptualized by this language study that a hill country village culture was developed in relation to hill country and Sabaragamu hills from a long time. By differentiating this hill country human culture as a new social set, a novel village cultural text could be introduced to Sri Lankan society.

**Key Words**: Conceptualization, Hill Culture, Kolonna, Naming of Villages, Regional Languages

## 1. හැඳින්වීම

ලෝකයේ විවිධ රටවල කඳුකර ආශ්‍රිතව ජීවත්වන මිනිසුන් විෂයයෙහි පවත්නා සංස්කෘතික විශේෂතාව කුමන ආකාරයකින් ප්‍රධාන සමාජයෙන් වෙනස් වන්නේද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අභිමතාර්ථය විය. ඒ සඳහා නියැදිය වශයෙන් තෝරා ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළයේ කඳුකර ගම්මාන සමූහයයි. සංස්කෘතික වශයෙන් එහි පවත්නා විශේෂතා අධ්‍යයනය කිරීම සඳහා කඳුකර වැසියාගේ භාෂා සංස්කෘතිය අධ්‍යයනය කිරීම වෙත පර්යේෂණයේ ක්ෂේත්‍රය සීමා කරගන්නා ලදි. ප්‍රදේශීය භාෂා ව්‍යවහාර අධ්‍යයනයේදී ලාංකේය කඳුකර සිංහල මානව සංස්කෘතිය බහුල වටිනාකම් සහිත ක්ෂේත්‍රයක් බව පැහැදිලි විය. එම මානව සංස්කෘතිය ස්වාධීන ප්‍රදේශීය ජන සංස්කෘතියක් වශයෙන් අභිවර්ධනය වන අයුරු නිරීක්ෂණය කළ හැකිය. ප්‍රදේශීය භාෂා විෂයයෙහි එම ගම්මානවල කඳුකර මානව ජීවිතය කෙරෙහි සාවධානව සිදු කරන ලද පර්යේෂණ නැත. ශ්‍රී ලංකාවේ කඳුකර ආශ්‍රිතව ජීවත්වන සිංහල ජනයාගේ සංස්කෘතිය හා සිංහල මහා සමාජයේ සංස්කෘතිය සසඳා බැලීමේදී වෙනස්කම් සහිතය. ස්වාධීන ප්‍රදේශීය සංස්කෘතික හා භාෂා ලක්ෂණ හේන් ගොවිතැන සමගත් කුඹුරු ගොවිතැන සමගත් දකුණු පළාතේ හා වියළි කලාපයේ සංස්කෘතික ලක්ෂණ සමගත් වෙනස්කම් බහුලය. වැසි වනාන්තර පද්ධතියක්වූ සබරගමුව කඳු වැටිය බෙහෙවින් වෙනස්කම් සහිත සංස්කෘතික ලක්ෂණවලට නිජභූමියක් වශයෙන් හැඳින්වීමට හැකියාවක් තිබේද? යන්න මෙම පර්යේෂණය මගින් පරීක්ෂා කෙරිණි. සිංහල ප්‍රදේශීය භාෂා ලක්ෂණ අධ්‍යයනයේදී නව දිශාවක් අධ්‍යයනය කිරීමට මෙම පර්යේෂණයේ උත්සාහ කෙරිණි. එනම් කොළොන්න කෝරළයේ කඳුකර සිංහල සංස්කෘතිය පිළිබඳවයි. සබරගමු කඳු වැටිය මූලික කරගත් ප්‍රදේශීය භාෂා ලක්ෂණ, විශේෂවූත් ස්වාධීනවූත් වාගාලාප විමර්ශනය අධ්‍යයන ක්ෂේත්‍රයේදී සිදු කරන ලදී. භෞගෝලීය පරිසරයෙහි තුළ සංස්කෘතිය වෙනස් වන්නේ එහි පවත්නාවූ විශේෂ අවශ්‍යතා හේතු කරගෙනය. ඉතා සශ්‍රීක භූමියක්වූ සබරගමු කඳු වැටිය ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාවක් අත් කරගැනීමත් එය වතු වගාව වෙත පරිවර්තනයත් මෑතකාලීනව සිදු විය. නගරාශ්‍රිත සිංහල භාෂාව මහා සමාජයේ භාෂාව වූවත් කඳුකර ආශ්‍රිත භාෂාව විවිධාංගීකරණය වීම එක් එක් ගම්මානවල විශේෂතාවක් විය. මෙම කඳුකර භාෂා රටා දක්නට ලැබෙන ප්‍රධාන ජීවනෝපායන් වශයෙන් සාම්ප්‍රදායික හේන් හා හෙල්මළු කුඹුරු ගොවිතැනත්, කඳුකර පතල් කර්මාන්තයත්, කිතුල් කර්මාන්තයත් ප්‍රධාන වේ. වර්තමානයේ තේ රබර් හා කුරුඳු ගොවිතැන වෙතටත් මිශ්‍ර භෝග ගෙවතු වගාවත් ජනප්‍රියවී තිබේ. එහි භාවිත භාෂාවද කඳුකර භාෂා සංස්කෘතියට ආවේණික වේ. කඳුකර භාෂා අනන්‍යතාව හා සමගාමීව සංස්කෘතික සමාජ ආර්ථික මෙන්ම සමාජ විශේෂතාව සංකල්පගත කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් සිදු කෙරේ.

මෙම පර්යේෂණය ප්‍රදේශීය භාෂා ව්‍යවහාර මත පදනම්ව ලංකාවේ ගම පිළිබඳ තර්කනයට ප්‍රපඤ්චාත්මක නවමු ප්‍රභේද සංකල්පීයකරණයක් යෝජනාකරන්නකි. මෙම අධ්‍යයනය උද්ගාමී තර්කනය හෙවත් පහළ සිට ඉහළට තර්ක කිරීම මත පදනම්ව සිදු කරන ගුණාත්මක පර්යේෂණයකි. විශ්ලේෂණාත්මක ක්‍රමවේදය මෙම පර්යේෂණයේ යොදාගන්නා අතර ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ප්‍රදේශීය භාෂා ව්‍යවහාර භාවිත කෙරිණි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන්, ශාස්ත්‍රීය ග්‍රන්ථ, පර්යේෂණ වාර්තා, පුවත්පත් ලිපි, අන්තර්ජාලය හා සම්මුඛ සාකච්ඡා භාවිත විය. තත් පර්යේෂණයේදී භාෂා අධ්‍යයනය සංස්කෘතික අධ්‍යයනයටත් අවසානයේ සමාජ හා මානව අධ්‍යයනයටත් යොමු කරවීම සිදු කෙරේ.

## 2. සාකච්ඡාව

මෙම පර්යේෂණයේ දී භාෂාව සංස්කෘතික ප්‍රභේදකරණයක් උදෙසා යොදා ගැනෙනුයේ සමාජ ප්‍රපඤ්ච විශ්ලේෂණයට භාෂාව යොදාගැනීමේ ක්‍රමවේදය මත පදනම් වෙමින්ය. පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි (1964)

කෘතියේදී හජිමෙ නකමුරා (1912-1999) පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි පූර්ණ විග්‍රහයකට ලක් කිරීම උදෙසා භාවිත කරන්නේ තුලනාත්මක භාෂා විශ්ලේෂණයයි. භාෂාව මානව සමාජය විග්‍රහය උදෙසා වැදගත් වන්නේ සියලු සමාජ ගොඩනැගීමේහී පදනම භාෂාව වන හෙයින්ය. ඕනෑම සමාජ නිර්මිතයක හා විභජනයක තීරණාත්මක සාධකය භාෂාව වේ (කෝල්ටර්, 1973). භාෂාව පාදක කරගෙන සංකල්පීයකරණය කිරීමේදී තීරණාත්මක සාධකයක් වශයෙන් ස්වාභාවික භාෂාවන්ගේ ඇති වැදගත්කම ජෙෆ් කෝල්ටර්ද පෙන්වා දෙයි. රඩල්ෆ් බෝතා (1942)ද සංකල්ප නිර්මාණකරණයේදී භාෂාවේ ඇති වැදගත්කම අවධාරණය කරන්නේ භාෂාවේ මූලික තැනුම් ඒකක වන පදිම විග්‍රහය සිය අධ්‍යයනවලට යොදාගනිමින්ය.

සිංහල භාෂාව තුළ උපභාෂා සංස්ථාපනය සිදුවූයේ විශේෂ සමාජීය හා භෞගෝලීය අවශ්‍යතා සැලකිල්ලට ගෙනය. එලෙස උපභාෂා ගොඩනැගීම නිසා භාෂාව තවත් වර්ධනයවීමටත් විවිධාකාර ස්වරූප ගැනීමටත් හේතු විය. උපභාෂා ගොඩනැගීම පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය විග්‍රහයක් ඉදිරිපත් කළ ලියෝනාඩ් බ්ලූම්ෆීල්ඩ් (1887 - 1949) විසින් සන්නිවේදන සනත්වය හේතුකරගෙන එකම සමාජයක විවිධ උපභාෂා ගොඩනැගීම පිළිබඳ අදහස් දක්වා තිබේ. මේ පිළිබඳ අදහස් දක්වන විමල් ජී. බලගල්ලේ විසින් උපභාෂා වශයෙන් හැඳින්වීමට හැකියාව ඇත්තේ කවර ලක්ෂණ මතද යන්නට නිර්වචන සපයයි. "එක් ප්‍රදේශයක හෝ එක් කොටසක භාෂා ව්‍යවහාරය තවත් ප්‍රදේශවල හෝ තවත් කොටස්වල හෝ භාෂා ව්‍යවහාරයට වඩා ඇතැම් අංගවලින් වෙනස් වන අතරම, ඒ ප්‍රදේශය තුළ හෝ ඒ කොටස තුළ හෝ සිටින සාමාජිකයන්ට පොදුවූ ලක්ෂණ සැහෙන ගණනකින් සමන්විත වන කල්හී, එම ප්‍රදේශීය ව්‍යවහාරයට නැතහොත් සමාජ ඛණ්ඩයේ ව්‍යවහාරයට 'උපභාෂා' (dailect) යැයි කියනු ලැබේ" (බලගල්ලේ, 2012). මෙසේ වන උපභාෂා එහි ස්වරූපය අනුව කොටස් දෙකකට හෙතෙම බෙදා දක්වයි.

- ප්‍රදේශීය උපභාෂා
- සමාජීය උපභාෂා

මෙම පර්යේෂණයෙන් සබරගමුව පළාතේ කඳුකර සිංහල ජනයාගේ ප්‍රදේශීය භාෂා ව්‍යවහාර කොළොන්න කෝරළයට අදාළව විමර්ශනය කෙරිණි. තත් විමර්ශනය සඳහා දායක කරගන්නා ලද්දේ කොළොන්න ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ගොන්ගල කඳු මුදුන අවට කඳුකර ගම්මාන වන දඩයම්කන්ද, බටහේන්කන්ද, රංහොටිකන්ද, මාළස්සාකන්ද, සූරියකන්ද, හෙට්ටිගමකන්ද, අලගල්කන්ද, හේනගොඩකන්ද, බුත්කන්ද, එගොඩකන්ද, නැදොලකන්ද, කෝප්පකන්ද, දැවැද්දනකන්ද, කැලිකන්ද, ඉත්තකන්ද, ජාතුංකන්ද, ඇදිමිටිකන්ද, විස්තරකන්ද, හෙළඋඩකන්ද යන ක්ෂේත්‍රයන්ය.

මෙම ප්‍රදේශීය භාෂාවන් පරිමිත භාෂා (restricted language) වශයෙන් හැඳින්විය හැකිය. කිසියම් සමාජීය ප්‍රස්තාවකට සීමාවූ අර්ථය ඉන් ලැබෙන බව බලගල්ලේ විසින් පෙන්වා දෙයි (එම). සබරගමුව කඳුකර ගම්මානවලට සුවිශේෂව මෙම ප්‍රදේශීය ව්‍යවහාර පැතිරී තිබේ. ප්‍රදේශීය භාෂා අධ්‍යයන විවිධ අන්දමින් ලාංකේය සංස්කෘතික හා භාෂා අධ්‍යයන ක්ෂේත්‍රයන්හි සිදු කර තිබේ. එම භාෂා අධ්‍යයන සිංහල භාෂා විකාශනයේදී සමාජ දූරස්ථභාවය සිංහල භාෂාවට කුමන අභිවර්ධනයන් සිදු කරන ලද්දේද යන්නට මහත් ඵලදායක පර්යේෂණ මගක් සකස් කර තිබේ. සමාජ දූරස්ථභාවය විසින් ඇතැම් සමාජ කොට්ඨාස හුදෙකලාවට පත්වීමත් එමගින් සිංහල භාෂාව ක්‍රමිකව වෙනස්කම් සහිත ප්‍රදේශීය භාෂා ලක්ෂණ ගොඩනැගීමට ලැබුණු හැකියාවත් විමර්ශනය කළ හැකි විය.

වාග් විද්‍යාඥයන් විසින් භාෂා අර්ථ අධ්‍යයනයේදී නිර්ණායක තුනක් ඉදිරිපත් කරයි. එම නිර්ණායකද ප්‍රදේශීය භාෂාවක් වෙන් කොට සංස්කෘතික අර්ථ කියැවීමේදී වැදගත් වෙයි.

- වාග් පරිසරය
- වාග් අනුපිළිවෙළ
- සමාජ පරිසරය (අස්සජීතිස්ස හිමි, 2017)

ලාංකේය කඳුකර ජනයාගේ වාග් පරිසරය සාමාන්‍ය ලාංකේය ගම පිළිබඳ සංකල්පය හා සසඳා බැලීමේදී සමාජ පරිසරය වෙනස්වීමත් වාග් පරිසරය වෙනස්වීමත් අනිවාර්ය සාධකයක්ය. ලාංකේය භාෂා ප්‍රවාහයේ පරිණාමය පිළිබඳ සමීපව විග්‍රහ කර බැලීමේදී සංස්කෘතිය හා භාෂාව පිළිබඳ සාකච්ඡාවට අත්‍යයන්තයෙන්ම මැදිහත්වීමක් සිදු කළ හැකි ප්‍රපංචයක් වශයෙන් මෙය හඳුනාගත හැකිය.

නූතන වාග්විද්‍යාවේ ආරම්භකයා වන ෆර්ඩිනන්ඩ් ඩී. සෝෂියර් (1857-1913) සිය දේශන මාලාව ඇතුළත් "Course in General Linguistics" (Cours de linguistique générale) කෘතියේදී ප්‍රධාන බෙදීම් දෙකක් ඉදිරිපත් කරයි. එනම්

- කාලානුසාරී වාග්විද්‍යාව
- කාලාපසාරී වාග්විද්‍යාව

ප්‍රදේශීය භාෂා අධ්‍යයනය යම්කිසි කාලයක පිහිටි භාෂා ප්‍රස්තරයක් හැදෑරීම වෙත යොමුවී තිබේ (අස්සජීතිස්ස හිමි, 2017). මෙහිදී භාෂාවේ ප්‍රස්තර යන යෙදුම කෙරෙහි විශේෂ අවධානයක් ලබාදිය යුතු වේ. භාෂාවේ ඇති සංස්කෘතික ප්‍රස්තර අනුව කරනු ලබන බෙදීමක් වශයෙන් ප්‍රදේශීය භාෂා අධ්‍යයන හැඳින්වීමේ හැකියාව තිබේ. විවිධ ජනයා සිදුකරන විවිධ වූ අර්පිතාර්ථයන්ගේ විවිධත්වය පෝෂණය වනුයේ ඔවුන්ගේ සංස්කෘතික ස්වරූපය අනුව බව සෝෂියර් පාදක කරගෙන පෙන්වා දිය හැකිය (වෝටර්මන්, 1956). මෙම විවිධත්වය අනුව හැඩගැසුණු සංස්කෘතික අධ්‍යයනයක් සිදු කිරීමේ උපායමාර්ගික හැකියාව මෙම පර්යේෂණයේදී අවධානයට ගැනෙයි.

සබරගමුව පළාත මධ්‍යම කඳුකරයෙන් නිරිතදිග බෑවුමට වන්නට පිහිටා තිබේ. "සබරගමුව පළාත පිහිටියේ ලංකාවේ මධ්‍යයෙන් තරමක් නිරිතදිග දිශානුගතවය" (නවරත්න, 2003). කඳුකර සිංහල භාෂාව ගවේෂණය කිරීමට අවශ්‍ය භෞගෝලීය පරිසාධන අවශ්‍යතාව සපුරා තිබෙන බව සබරගමුව පළාතේ පිහිටීමෙන් පැහැදිලි වේ. "රත්නපුර දිස්ත්‍රික්කයේ උතුරු මායිමෙහි ලංකාවේ ඓතිහාසික වැදගත්කමකින් යුත් මීටර 2243ක් (අඩි 7300) උස්වූ ශ්‍රී පාද කන්ද පිහිටා ඇත. එහි ඊසාන දිග මායිමෙහි මීටර් 2395 (අඩි 7857) උස්වූ කිරිගල්පොත්ත කඳු සහ මීටර් 2381ක් (අඩි 7741) උස්වූ තොටපළ කන්දද එහි දකුණු දිග මායිමෙහි මීටර් 1358ක් (අඩි 4456) උස්වූ ගොන්ගලද පිහිටා ඇත" (එම). ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ උස්බිම් සංකීර්ණයට අයත් වන බව පැහැදිලිය. "සබරගමු පළාතෙහි රත්නපුර දිස්ත්‍රික්කය මුළුමනින්ම පාහේ උස්බිම් සංකීර්ණයට අයත් වන අතර ...." (එම) මෙනිසා සබරගමු පළාතට අයත් කඳු වැටි අතර ගොන්ගල කඳු මුදුන සබරගමු කඳු වැටියේ උසම කඳු මුදුන වේ. තවදුරටත් සබරගමු පළාත පිළිබඳ හැඳින්වීමේදී "අද සබරගමු පළාත කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවලින් සමන්විත, මධ්‍ය කඳුකරයේ බටහිර අර්ධයේ පාවුල් කඳුකර ප්‍රදේශ හරහා පටියක් මෙන් විහිදෙන, දළ බෑවුම් සහිත භූමිභාගයකි" (බණ්ඩාර, 2003). මෙම ගොන්ගල කඳු මුදුන අවට කඳු භූමිය වටා ජීවත්වන සිංහල ජනයාගේ ප්‍රදේශීය සිංහල භාෂා ව්‍යවහාර මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කෙරෙයි.

කඳුකර ප්‍රදේශයන්හි ජීවත්වන ගැමියාගේ චෛතසිකය හා මානසික පරිසරය ගොඩනැගීමේලා සහසම්බන්ධිත දායකත්වයක් ඔවුන් ජීවත්වන භෞගෝලීය පරිසරය විසින් සපයා දෙනු ලැබේ. සබරගමුව පළාතේ ඇති භෞගෝලීය පරිසරය එකී සමාජයේ භාෂා සංස්කෘතිය ගොඩනැගීමට දැඩිව දායකවන ප්‍රධාන උත්ප්‍රේරකයක්ද වේ. දැනට සම්භාවිත සිංහල භාෂාව හා මෙම කඳුකර පරිසරයන්හී ජීවත්වන ජනයා භාවිත කරන සිංහල භාෂාව අතර පැහැදිලි වෙනස්කම් දක්නට ලැබෙයි. එසේ වන්නේ පහත අංග ලක්ෂණයන්ගෙනි.

- ප්‍රදේශීය වූ විකල්ප වචන භාවිතය
- උච්චාරණයේ පවතින වෙනස්කම්
- ග්‍රාමීය ඌරුවකට සකස් කරගත් භාෂා වෙනස්කම්

උක්ත ලක්ෂණ පදනම් කරගෙන කඳුකර සිංහල භාෂාවේ විවිධ ස්වරූප විමර්ශනය කළ හැකිය. මින් ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ ප්‍රදේශීය වූ විකල්ප වචන භාවිතය වේ. මුළුමනින්ම පාහේ වෙනස් ලක්ෂණ දක්නට ලැබෙන මෙම ප්‍රදේශීය වචන එකී සමාජයේ විවිධ සංවාද ඇසුරින් විමර්ශනය කිරීමට හැකි විය. එක්

ගමක භාෂා උච්චාරණය තවත් ගමක උච්චාරණයට වෙනස් විය. එනමුත් කඳුකර භාෂා ව්‍යවහාරයෙහි දක්නට ලැබුණු ප්‍රධාන වෙනසක් වූයේ උච්චාරණයේදී ඇද පැද ළෙලවා කතා කිරීමය. එම උච්චාරණයන් වර්තමානයේ එම සමාජයේම උපන් විධිමත් පාසල් අධ්‍යාපනයක් ලද පිරිස් අතරෙහි දක්නට නොලැබෙයි. තවද සම්භාවිත සිංහල භාෂාවේ දක්නට ලැබෙන වචන එයාකාරයෙන්ම නොව ග්‍රාමීය ඌරුවකට උච්චාරණය කිරීම දක්නට ලැබේ.

සිංහල භාෂා සංස්කෘතික විශ්ලේෂකයන් හා ජනශ්‍රැතිවේදීන් බහුලව අවධානයට ගනු ලැබුවේ මඩ ගොවිතැන ආශ්‍රිතවත් දකුණු පළාත මෙන්ම ආදිවාසී ප්‍රදේශීය භාෂා ව්‍යවහාරයනුත්ය. බහුල පර්යේෂණ හේතුවෙන් එම භාෂා ව්‍යවහාර මේ වන විට නිර්මාණකරණයේදීත් කතා ව්‍යවහාරයේදීත් භාවිත කෙරේ.

මිනිසා හුදෙකලාවට පත් කරන කඳුකර වැසි ජීවිතය විශ්ලේෂණයේදීත් විමර්ශනයේදීත් අවධානයට ගත යුතු විශේෂතා රාශියකින් යුතුය. මෙම ප්‍රදේශයන්හි ජීවත්වන ජනයාගේ මානසික ආහාර වශයෙන් කලා සංස්කෘතියට වඩා වැඩි බලපෑමක් ලැබෙන්නේ ස්වභාවික කඳු වැටි දියඇලි ගංගා ඇළ දොළ මෙන්ම වනාන්තරගත ජීවිතයෙනි. ඔවුහු එම පරිසරයේ ස්වරූපයෙන් සිය මානසික ආහාර සන්තර්පණය කර ගැනීමෙන් වෙනස්වූ කලාත්මක වින්දනයක් ලබති. ඒ සඳහා ඔවුන් විසින් විධිමත් කලා ස්වරූප නොව ස්වාභාවික පරිසරය ආශ්‍රයෙන්ම ගතකරන මානසික ආහාර රටාවක් පවත්වාගෙන යනු ලැබේ.

මානව ජීවිතය සංවිධානයවීම සඳහා දින චර්යාව ගොඩනැගීම සලකා බැලිය යුතු තවත් ලක්ෂණයකි. විශේෂයෙන් කඳුකරයේ එක් තැනක සිට තවත් තැනකට යාම සහ විවිධ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම විශාල ශාරීරික ශක්තියක් වැය කළ යුතු ක්‍රියාවලියකි. මෙනිසා කඳුකර වැසියාට හුදෙකලා තත්ත්වයනට නිරන්තර පත්වීමටත් සිදු වේ. ඉතා පහසුවෙන් ගමන් කළ හැකි ප්‍රවාහන ක්‍රමවේදයක් කඳු භූමිවල දක්නට නොවේ. ඒ සඳහා ඇති ක්‍රමවේදය වන්නේ පයින් ගමන් කරන්නට සිදුවීමය. කඳු මුදුනටත් කඳු මුදුනේ සිට පහළටත් විවිධ අවශ්‍යතා අනුව ඔවුන් ගමන් කරන්නේ ඒ සඳහා වෙනත් විකල්පයක් නොවන බැවිනි. ඉතාමත් බහුල බෑවුම් සහිත භෞගෝලීය පරිසරයන්හි ජීවත් වෙන වැසියනට මෙකී මානව ජීවිතය සංවිධානය කර ගැනීමට මෙම කඳුකර දින චර්යාව නිරන්තර බලපෑමක් සිදු කරයි.

කඳුකරයෙහි මාර්ග පද්ධතිය ක්‍රමවත්ව සකස් කරන ලද්දේ යුරෝපීය ජාතිකයන් විසිනි. ඔවුන් විසින් සිය බෝග ප්‍රවාහනය සහ නිෂ්පාදනය සඳහා වතු වගා ක්‍රමය ස්ථාපිත කළ අතර ඒ සඳහා අවශ්‍ය මාර්ග පද්ධතිය විධිමත් ආකාරයට සකස් කරන ලදි. එම විධිමත්ව සකස් කරන ලද මාර්ග පද්ධතිය ඔවුන්ගේ වතු වගා කටයුතු සඳහාම සකස් කරන ලද්දකි. එම මාර්ග සිංහල ජනයාගේ ජීවිතය ඉලක්ක කර ගොඩනගන ලද්දක් නොවේ. නමුත් පසුකාලීනව මෙම කඳුකර වැසියන් සඳහා මාර්ග පද්ධති සකස් කෙරුණු අතර අදටත් බහුල නිවෙස් ප්‍රමාණයකට මාර්ග පහසුකම නොවන බවත් ඔවුන් ආසන්නතම මාර්ගයේ සිට විශාල දුරක් පයින් ගමන් කොට සිය නිවසට ළඟා වන තත්ත්වය දක්නට ලැබේ. මෙනිසා සියලු කටයුතු විෂයයෙහි ඔවුනට දැරිය යුතු ශාරීරික වෙහෙස ඉතාමත් විශාලය. මාර්ග පද්ධතියේ දුර්වල බවද කඳුකර සිංහල වැසියාගේ මානව භාෂාව විශේෂිකරණයට ලක්වීමට හේතුවී තිබේ.

කඳුකරයේ පවතින තැනිතලා ඉඩම් යුරෝපීය ජාතිකයන් විසින් පැහැර ගැනීමට ලක් කරන ලද බැවින් සිංහල වැසියන් සඳහා ඉතිරි වූයේ වනාන්තර අභ්‍යන්තරයේ පවතින බෑවුම් සහිත පරිසර පද්ධති පමණි. එම පරිසරය සිංහලයන් විසින් වගා කටයුතු සඳහා භාවිත කෙරිණ. එකී පරිසරය මගින් ඔවුන් විසින් සිය ආර්ථිකය ශක්තිමත් කරගැනීම සඳහා වෙහෙසුණු බැවින් හුදෙකලාවට හා ප්‍රදේශීයකරණයට ලක්වී තිබේ. මෙයද කඳුකර සිංහල භාෂාව විශේෂිකරණයට ලක්වීමට භෞගෝලීය පරිසරය විසින් ලැබුණු තවත් විශේෂ උත්ප්‍රේරකයක් වේ. කඳුකර භාෂාවේ පවතින විශේෂතා ගොඩනැගීමට මිනිසා වනාන්තර අභ්‍යන්තරයේ හුදෙකලාවට ලක්වීම නිරන්තර දායකවී තිබේ. එම හුදෙකලා සංස්කෘතියෙන් නිපන් ප්‍රදේශීය භාෂා ව්‍යවහාර පහත පරිදි වේ.

සැල් වෙනවා - පොඩි වෙනවා

උඩු හුළඟ - උඩින් හමනා සුළඟ

යටි හුළඟ - යටින් හමනා සුළඟ

දියබත් වෙනවා - වර්ෂාවට බොහෝ වේලා තෙමීම

හිමේ යනවා - කන්ද මුදුනට යාම

බිලේ - ගසක මැද ඇතිවන සිදුරු

මහ හිමේ - විශාල කඳු මුදුන

කුඩා හිමේ - කුඩා කඳු මුදුන

අලි මඩේ - අලින් මඩ කළ තැන

නා ලීය - බත් කෙන්ඩේ ඉදිරිපස ඇටකුර සහිත කොටස

දෙබොක්කාව - කන්දක පිහිටි වල සහිත කුඩා කඳු ආවාටය

නාය - නාය ගිය ප්‍රදේශය

හුළං කපොල්ල දැඩි හුළඟ සහිත ස්ථානය

මං මුළා වැල - වනාන්තරයේ ඇතැයි කියන වැල් වර්ගයක්

හුස්ම - කෙටි වේලාව

හති හානිය - වෙහෙස

තණ්ඩිය - කලවය

යටි හුළඟ - වනාන්තරය ඇතුළත පහතින් හමන සුළඟ

පේරිය - විශාල බෑවුමක් සහිත ප්‍රදේශය

ගල් පේරිය - ගල් සහිත බෑවුමක් සහිත ප්‍රදේශය

බඩ ගහ - ශක්තිමත් නැති ගස

යකඩ ගහ - ශක්තිමක් ගස

රෑල් පොල්ල - කෙළින් ගස

කෝඩෙ කාලේ - මීදුම සහිත කාලය

පිනි හඩුව - කැලෑ ප්‍රදේශයක උදේ කාලය හෝ වැස්සෙන් පසු කාලය

හඩුව - කුඩා කැලෑව

හති කඩනවා - ගිමන් හැරීම

උහු ගෙඩියා - උකුස්සා

කඩාලනවා - අත පත ගෑම

කැළැත්තෙනවා - කළවම් වීම

බෙරිහං දෙනවා - වැඩි ශබ්දයෙන් කතා කිරීම

පට්ට ගියා - අමාරු වැඩක් කිරීම / ඇඟ සීරීමකට ලක් වීම

මාළුවා කට ඇරියා වගේ කැපුණා - ශරීරය තුවාල වීම

තැන්නපිට - උස් මුදුනක පිහිටි තැන්න

හෝදපාළුව - භූමිය හේදී යන භූමිය

ගස් ගඳ - ගස් නැගීමෙන් පසුව ඇතිවන දුගඳ

කොහොල්ලෑ පිළියං කරනවා - බිඳුණු හා සිදුරු වූ ප්ලාස්ටික් භාජන කොහොල්ලෑවලින් අලුත්වැඩියා කිරීම

රබ්බඩ - ඉතා හොඳින් ඉදුණු පුවක් ගෙඩි

හේත්තුව - ආධාරකය

බුදු හේත්තු - බෝගස

බුදු පිට - බෝ ගස

කඳුකර ගම්මාන ආශ්‍රිත කෘෂිකර්මාන්තය මුලින් හේන් ගොවිතැන පදනම් කරගෙන ගොඩනැගුණද පසුකාලීනව වතු වගාව සඳහා යොමුවීම සාමාන්‍ය තත්ත්වය විය. විශේෂ ලක්ෂණයක් වශයෙන් බ්‍රිතාන්‍ය වතු වගා හුරුව කඳුකර සිංහල වැසියා විසින් අන්තර්ග්‍රහණය කරගෙන කුඩා ගෙවතු ව්‍යාපාර වශයෙන් පවත්වාගෙන යාම බොහෝවිට දක්නට ලැබෙන ලක්ෂණයකි. කඳුකර කෘෂිකර්මාන්තය ආශ්‍රිත භාෂාව දකුණු හා උතුරු පළාත්වල කුඹුරු ගොවිතැන හා සමාන නොවේ.

කෘෂිකර්මාන්තය වශයෙන් වර්තමානයේ කුඩා තේ වතු හා කුරුඳු වගාව පවත්වාගෙන යන මෙම පිරිස බහුල බෝග සිය ගෙවත්ත තුළ වගා කර ගනිමින් අවශ්‍යතා සිය ගෙවත්තෙන්ම සපුරා ගන්නා ආකාරයද නිරීක්ෂණය වෙයි. එසේම ගෘහ ආශ්‍රිත කඳුකර මානව භාෂාව තවත් ලක්ෂණයක් වන්නේ පොල් අතු සෙවිලි කළ සාම්ප්‍රදායික සාමාන්‍ය ගෙවල්වලට වඩා වෙනස්වූ නිවෙස් ගොඩනැගීමේ යාන්ත්‍රණයක් අතීතයේ පැවතී තිබීමයි. විශේෂයෙන් ඉලුක් සෙවිලි කරන ලද කඳුකර නිවාස හා කඳන් පොතු බිත්තිවලට ඇහිරීමෙන්ද ගොඩනගන නිවාසද වේ. මෙම ගෘහ ආශ්‍රිතවද විවිධ භාෂා ව්‍යවහාර හා ප්‍රදේශීය භාෂා ලක්ෂණ දක්නට ලැබේ.

**කඳුකර ගොවිතැන ආශ්‍රිත ප්‍රදේශීය භාෂා ව්‍යවහාර**

ළා ඉදල - කුරුල්ලන් අල්ලා ගැනීමට කොහොල්ලෑ ගා සකස් කළ කුඩා ගස

යටි අළුව - කපන ගසක යටි කැපුම

උඩ අළුව - ගසක උඩින් කපන කැපුම

කට දයියං - මිරිස්

පුබ්බරුවං - බත්

පුරවනු - ගෝනි

තේ කැල්ල - තේ වත්ත

කුරුන්ද - කුරුඳු වත්ත

ඌරු අහර - ඌරන් යන කැලෑ මාර්ගය

ඉත්තෑ අහර - ඉත්තෑවන් යන මාර්ගය

තලප අහර- තලපයන් යන මාර්ගය

බිමලනවා - භාජනයක ඇති යමක් බිමට දැමීම

දලු දානවා - තේ දලු ගෝනිවලට දැමීම

බොලේ - ඔයා

හනික වරෙං - ඉක්මනට එන්න

එඤ්ං - එන්නම්

උඤ්ඤං කොල්ලා - බාල කොල්ලා

උඤ්ඤං කෙල්ල - බාල කෙල්ල

පවුල් පරිසරය ආශ්‍රිත කඳුකර සිංහල භාෂාවද මෙහිදී අවධානය යොමු කළ යුතු ලක්ෂණයක් වේ. පවුල් පරිසරය සේම සමාජීය ස්වරූපයේ පවතින ලක්ෂණ මෙම කඳුකර සිංහල භාෂාව විෂයයෙහි බලපෑම් කරයි. එසේම එක් එක් ගම්මානයට විශේෂයෙන් ගොඩනැගුණු භාෂා ව්‍යවහාරද වෙනස්කම්ද දක්නට ලැබීම විශේෂත්වයක් වේ. තවද ආගමික කටයුතු ආශ්‍රිත කඳුකර සිංහල භාෂාවද විශේෂය. විශේෂයෙන් මෙම ලක්ෂණය වඩාත් දක්නට ලැබෙන්නේ ශ්‍රීපාද සංස්කෘතිය මූලික කරගෙනය. ගම්මානවල පවතින ආරණ්‍යවාසී විහාරස්ථාන බොහෝ වනාන්තරගතව තිබීමත් එහි හුදෙකලා ස්වරූපයත් නිසා ආගමික වශයෙන් විවිධ ස්ථානයන්හි විශේෂ භාෂා ව්‍යවහාර ගොඩනැගී තිබේ.

තේ වගාව ආශ්‍රිත කඳුකර ප්‍රදේශීය ව්‍යවහාර

අරිම්බුව - කුඩා තේ දල්ල

වංගි - නිසරු පත්‍ර

තනි කොලේ - කුඩා පත්‍රය

නීරුවාදු කපනවා - කප්පාදු කර ගසේ ආරක්ෂාවට ඉතිරි කළ අවසන් අත්ත කපා දැමීම

කැල්ලට යනවා - ගොවිබිමට යාම

ශ්‍රී පාද වන්දනා සංස්කෘතිය කඳුකර සිංහල භාෂාවේ ප්‍රධාන නිරූපණයක් ලෙස අධ්‍යයනය කළ හැකිය. මෙහි විශේෂතාව වන්නේ එම විශේෂ ප්‍රදේශීය භාෂාව ලංකාව පුරා පැතිර යාමේ හා භාෂා සංස්කෘතිය පවරාදීමේ භාවිතයක් වශයෙන් ශ්‍රී පාද වන්දනාවේ යාම අර්ථකථනය කිරීමට හැකි වීමය. මෙම ලක්ෂණවලට අමතරව කිතුල් කර්මාන්තය ආශ්‍රිතව කඳුකර මානව භාෂාව ප්‍රධාන ජනශ්‍රැතික වටිනාකමකින් යුතු නාමකරණ සමුදායක් වශයෙන් හා ප්‍රදේශීය භාෂාවේ ව්‍යවහාරයක් වශයෙන් හැඳින්වීමට හැකිය. කිතුල් මල් කර්මාන්තය ආශ්‍රිතව ප්‍රදේශීය භාෂා ව්‍යවහාර රාශියක්ද දක්නට ලැබේ. එම භාෂා ව්‍යවහාර වර්තමානය වන විට භාවිතයට ගැනීම අඩුවී ඇත්තේ සාම්ප්‍රදායික කර්මාන්තයෙන් වාණිජ බෝග වෙතට ජනයා ශීඝ්‍රයෙන් මාරුවීම හේතුවෙනි. තවද කිතුල් සංස්කෘතිය සබරගමුවේ විශේෂ වැදගත්කමක් සහිත වෘත්තීයයක් වේ. ඒ හා සම්බන්ධ විශාල ප්‍රදේශීය භාෂා සංස්කෘතියක් මෙම කොළොන්න කෝරළයට අදාළව දක්නට ලැබෙයි. කිතුල් කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාර පහත පරිදිය.

පොත් කරනවා - වැල් කපා වළලු සාදා එකතු කිරීම

මන්නලෙල්ල - පිහියා මුවහත් කරන ලීය

ඔලොම්බින්න - කිතුල් මල රඳවන ආධාරකය

හැර බඳිනවා - කිතුල් ගසට රිටක් තබා බැඳීම

දික් හැර බඳිනවා - හොරුන්ට නැගගත නොහැකි සේ කිතුල් ගස්වල දිගු පියවරකින් හැර බැඳීම

දෙකැති කපනවා - දිනකට දෙවරක් කිතුල් මල කැපීම

තුන්කැති කපනවා - දිනකට තෙවරක් කිතුල් මල කැපීම

මල ඇරෙනවා - කිතුල් මල කැපීම අතහැරීම

මල වේලනවා - අව්වට කිතුල් මල නිරාවරණය කිරීම

උක්ත ප්‍රදේශීය භාෂා ලක්ෂණ කොළොන්න කෝරළයේ කඳුකර ගම්මානවල ප්‍රදේශීය භාෂා ලක්ෂණය. ශ්‍රී ලංකාවේ කඳුකර මානව සංස්කෘතිය මෙම භාෂා ප්‍රයෝග පදනම් කරගෙන නව අධ්‍යයන ප්‍රවේශයකට ලක් කළ යුතු විශේෂ ක්ෂේත්‍රයක් බව මින් පැහැදිලි වේ. කඳුකර භාෂාව මෙන්ම ආහාර සංස්කෘතියද සංස්කෘතික තත්ත්වය ආදියත් විශේෂයෙන් අවධානයට ගත යුතු වෙයි.

ආහාර රටාව විෂයයෙහිත් සමාජ සංස්කෘතික හා දේශපාලන කාර්යයන් විෂයයෙහිත් නව සංස්කෘතික පදාසයන් විවෘත කර ගැනීමේලා මෙම කඳුකර සිංහල සංස්කෘතිය අධ්‍යයනයෙන් හැකියාව ලැබේ. කඳුකරයේ ජීවත්වෙමින් එම කඳු පරිසරය සිය ජීවනෝපාය සඳහා දායක කරගන්නා ප්‍රධාන මාධ්‍යයන්ද අනාවරණය විය.

ලාංකේය කඳුකර මානවයාගේ කඳුකර මැණික් පතල් කර්මාන්ත සංස්කෘතිය මෙම සබරගමු කඳු වැටිය මූලික කරගෙන ගොඩනැගී ඇති විශේෂ ප්‍රදේශීය සංස්කෘතික ව්‍යුහයකි. එය සාම්ප්‍රදායික පතල් කර්මාන්තයෙන් වෙනස් වන අතර එහිදී යොදාගන්නා සංස්කෘතික කටයුතුද වෙනස් වේ. බොහෝ විට නියඟ පවතින කාලවල කඳුකරයට ගැමියන් විසින් සති කිහිපයක් නැවතී සිටිමින් මැණික් සෙවීමේ කටයුතු කරනු ලබයි. වනයට අධිපති මංගර දෙවියන්ට කොහොඹ තෙල් පහනක් පූජා කිරීමෙන් හා සබරගමු අඩවියට අධිපති සමන් දෙවියන්ට පූජා කටයුතු කිරීමෙන් පසුව එම කටයුතු ආරම්භ කරයි. එහිදී භාවිත වන ප්‍රදේශීය භාෂා ව්‍යවහාර වන්නේ,

පුස්සට අහු වෙනවා - කලින් හාරන ලද පතලක් හමු වීම

මාත්තුව - ගලක පිපිරීමට ලක්ව ඇති තැන

දෙනිකඩේ - වගුරු බිම

තෙප්පින්න - ලීයකට සවි කරන ලද යකඩ උලක් සහිත ආයුධයකි

අලවංගුව - කුඩා යකඩ කුරක් වන පස් බිඳීමට ගන්නා ආයුධය

කැස්ටිං කුර - දිගු යකඩ කුරක් වන පස් බිඳීමට ගන්නා ආයුධය

ඇදුං පතල - ගඟ මැද සැඩ පහර උපයෝගී කරගෙන කරනු ලබන පතල් විශේෂයකි

කත්තු - අඩි පොල්ල වහල් පොල්ලට

වහල් පොල්ල - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

ඇලපත් කණු - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

ඇලපත් පේකඩ - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

දිගං - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

මැද මුක්කු - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

මාලාව - ඉල්ලමට යටින් ඇති මැටි ස්තරයකි

මුල් කණු - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

කැෂ්ටිං කුර - බිම

පත්ත - යකඩ ආයුධයකි

ඇලපත - දෝනාවේ දෙපස

මූණත - දෝනාව බිඳගෙන යන දිශාව

ඇලපත් කීරි - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

වහල්ලැලි - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

හයි දිගං - පතලය උදෙසා සාදන ලී දණ්ඩකි

ඇදුං උදැල්ල - ඉල්ලං ඇදීම සඳහා භාවිත වන උදැල්ල

තෙප්පින්න - ලීයකට යකඩ කුරක් සවි කළ වතුර වළක අඩියේ පස් බිඳින උපකරණය

හිටු වඩිය - ඇදුං පතලක මැණික් බලන දිය පහර සහිත කොටස

තිරිංගය - ගල් ඇදීමේ උපකරණය

කුළා - කුළු ගෙඩිය

ගැරඩි පූනක්කං - වටිනාකමක් නැති වර්ණවත් ගල් විශේෂයක්

වාඩි බත - වාඩියේ පිසූ බත

බංගලා වල - දෝනාවෙන් තවත් දෝනාවකට යාම

ඉල්ලං වර්ග - කහ ඉල්ලම, ගොඩ ඉල්ලම, ගොම ඉල්ලම, හබොල්ල ඉල්ලම, කළු ඉල්ලම, මිණිරං ඉල්ලම

ගල් වර්ග - කිරිවනා ගල්, වීදුරු ගල්, පුන්නක්කු ගල්, කහඳ ගල්

මුක්කරු - ආදි කාලයේ මැණික් සෙවූ පිරිසකි. මොවුන් විසින් මැණිකවල සිදුරු විද තිබේ. එය ජනශ්‍රැතියේ පවතින කතාන්දරයක් වේ. කඳුකර භාෂාවේ දක්නට ලැබෙන තවත් ලක්ෂණයක් වන්නේ සම්භාවිත ප්‍රධාන භාෂාවේ වචනවල සංවිධිතභාවය ග්‍රාමීය උච්චාරණ ක්‍රමවිධියකට සකස්කර ගැනීමයි.

| විධිමත් ව්‍යවහාරය | කඳුකර ව්‍යවහාරය |
|---|---|
| කරන්නම් | කරඤ්ඤං |
| කන්නම් | කඤ්ඤං |
| පුංචි | උඤ්ඤං |
| කන්න | කාපං |
| බොන්න | බීපං |
| යන්න | පලයං |
| ගිනි තියනවා | ගිල්ලනවා |
| කේන්ති | කේන්චි යනවා |

මෙම පර්යේෂණයේදී ලාංකේය කඳුකර ගම්මාන අධ්‍යයනයේ ලා විශේෂ ප්‍රවේශයක් යෝජනා කිරීම සිදු කරනුයේ එහි ප්‍රදේශීය භාෂාව පාදක කර ගනිමින්ය. ඔවුන්ටම අනන්‍යවූ සමාජ සංස්කෘතියක් වශයෙන් හඳුනාගෙන විශේෂකරණයකට ලක් කිරීමෙන් නව සමාජ සන්දර්භයක් හඳුනාගැනීමට කඳුකර ගම්මානවලින් හැකි විය.

## 3. සමාලෝචනය

මෙම පර්යේෂණය කොළොන්න කෝරළයේ කඳුකර ගම්මාන ආශ්‍රිත ප්‍රදේශීය භාෂා ලක්ෂණ මත පදනම් වෙමින් මෙතෙක් සංකල්පිත සාම්ප්‍රදායික ලාංකේය ග්‍රාම ව්‍යුහයට නව ග්‍රාම ව්‍යුහයක් යෝජනා කිරීම සිදු විය. එනම් කඳුකර මානව සංස්කෘතිය මත පදනම්වූ ග්‍රාමීය සමාජයක තත්ත්ව හඳුනා ගැනීමට හැකි වීමය. කඳුකරය හා බැඳුණු මානව ක්‍රියාකාරකම් විමර්ශනය උදෙසා සංස්කෘතික කථිකාවතක් මෙම කඳුකර සංස්කෘතිය පිළිබඳ සංකල්පයේදී ගොඩනැගීම සිදු කළේය. ලංකාවේ විශාල ජනගහණයක් වාසය කරන කඳුකර භූමිය, එහි වාසය කරන මිනිසුන්ගේ ශාරීරික හා මානසික වශයෙන් කඳුකරය අන්තර් සහයෝගීව බැඳී පවත්නා අතර මෙම භෞගෝලීය සාධකය නොසලකා සංස්කෘතික සැකැස්මේ සිට සමාජ ක්‍රියාවලි කිසිවක් පරිපූර්ණ වශයෙන් සිදු කිරීමේ හැකියාවක් නැති බව පැහැදිලි විය. මෙම කඳුකරවාසීන්ගේ ආර්ථිකය නගා සිටුවීම වැනි ව්‍යවහාරික ප්‍රායෝගික තත්ත්ව කළමනාකරණය කිරීමට පවා කඳුකර මානව සංස්කෘතියක් වශයෙන් කථිකාමය ශක්තියක් එකී සංස්කෘතියට ප්‍රදානය කළ යුතු වේ. මෙම පර්යේෂණය සරල ප්‍රදේශීය භාෂා ව්‍යවහාර හරහා සමාජ ව්‍යවහාර සංකථනයක් ගොඩනැගීමට යොදාගත් නවමු පර්යේෂණයක්ද වේ. භාෂා අධ්‍යයන සමාජ සංස්කෘතික දේශපාලන ව්‍යුහ වෙතින් විගලිත නොවන බව මෙම පර්යේෂණයේදී පැහැදිලි විය. මෙම ජනයා වෙනස් සංස්කෘතියක් වශයෙන් යෝජනා කිරීමෙන් එම මානව චර්යා සමාජ සංස්කෘතික දේශපාලනික හා ආර්ථික වශයෙන් සුවිශේෂ බවකින් ග්‍රහණය කරගැනීමට හැකි බව පැහැදිලි විය.

## පරිශීලිත මූලාශ්‍රය


අභයවර්ධන, එච්. ඒ. පී., (2002). ***සබරගමුව ප්‍රවේණිය***, පළමු මුද්‍රණය, රත්නපුරඃ සබරගමුව සංවර්ධන බැංකුව.

අස්සජිතිස්ස හිමි, කුරුපිට. (2017). ***වාග්විද්‍යා විමර්ශන***, කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ඇඳගම, පී., (2003). ***සබරගමු වංශකතාව 2 වෙළුම***, රත්නපුරඃ සබරගමුව පළාත් සභාව.

ඇඳගම, පී., (2003). ***සබරගමු වංශකථාව 1 වෙළුම***, රත්නපුරඃ සබරගමුව පළාත් සභාව.

ඇඳගම, පී., (2003). ***සබරගමුව වංශකථාව 3 වෙළුම***, රත්නපුරඃ පළාත් සභාව.

ඥානවිමල, කේ., (1942). ***සපරගමුවේ පැරණි ලියැවිලි***, කර්තෘ ප්‍රකාශන.

ඥානවිමල, කේ., (1967). ***සපරගමු දර්ශන***, රත්නපුරඃ කර්තෘ ප්‍රකාශන.

ඥානවිමල, කේ., (2001). ***සබරගමුවේ පැරණි ලියැවිලි,*** බොරලැස්ගමුවඃ කර්තෘ ප්‍රකාශන.

බලගල්ලේ, විමල් ජී., (2012). ***භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය***, කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

බිනරගම, ඩී., (2006). ***සබරගමුව පැරණි රජදහන***, පළමු මුද්‍රණය, කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමසුන්දර, ඩී., (2011). ***සබරගමු උරුමය***, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Botha, R. P. (1986). ***The role of conceptualization rules in the interpretation of morphologically complex words. Acta Linguistica Academiae Scientiarum Hungaricae***, 36(1/4), 25–37. Available at: http://www.jstor.org/stable/44310562

Coulter, J. (1973). ***Language and the conceptualization of meaning. Sociology***, 7(2), 173–189. Available at:

Waterman, J. T. (1956). ***Ferdinand de Saussure-Forerunner of Modern Structuralism***. The Modern Language Journal, 40(6), 307–309. [Online] Available at: https://doi.org/10.2307/320256.